**02**

# ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් අනුගමනය කළ ශාසනික ප්‍රතිපත්තිය පිළිබඳ අධ්‍යයනයක්

# A Study of King Sri Wickrema Rajasingha's policy towards the *Buddha Sasana*

ඊ.ඩබ්ලිව්.ඒ.එච්.සී. ගුණසිංහ,

**සාරාංශය**

ක්‍රි.පූ. තුන්වන සියවසේ සිදුවූ මහින්දාගමනයෙන් මෙරට ස්ථාපනය වුණු බුදු සසුන ක්‍රමයෙන් රාජත්වය සමඟ අවිච්ඡින්න සබඳතාවක් පවත්වන ආයතනයක් බවට පත් වූ හෙයින් ලක්දිව රජු අනිවාර්යයෙන්ම බෞද්ධයෙක් වී බෞද්ධ පාලන ප්‍රතිපත්තිවලට අනුකූලව පාලනය ගෙනයාමට බැඳී සිටියේ ය. රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමේ කාර්යය හිමිකරගත් භික්ෂූන් වහන්සේ අනුශාසක කාර්යයට පමණක් සීමා නොවී විටෙක රජුන් තනන්නන් මෙන්ම තවත් විටෙක රජුන් නසන්නන් වශයෙන් ද කටයුතු කරමින් රාජ්‍ය දේශපාලනය තුළ අධිකාරී බලයක් පවත්වා ගැනීමට සමත් වුණි. මේ නිසා බුදු සසුනට අනුග්‍රහ දැක්වීම තුළින් රාජ්‍ය පාලනයට අවශ්‍ය භික්ෂූන් වහන්සේගේ සහය ලබාගැනීමට රජවරු කටයුතු කළහ. මෙකී තත්ත්වය උපතින් හින්දු භක්තිකයන් වූ උඩරට රාජධානියේ පාලකයන්ව සිටි නායක්කර් වංශික රජවරුන්ගේ පාලනයේදී පවා නොවෙනස්ව පැවතුණි.

උඩරට රාජධානියේ අවසන් රජු වශයෙන් සැලකෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලය තුළ නොයෙක් අර්බුද පැවතිය ද, රජු විසින් පෙර රජුන් සේම බුදු සසුන සහ භික්ෂූන් වහන්සේ උදෙසා අනුග්‍රහ දක්වා ඇති බව පෙනෙන්නට තිබේ. එහිදී දළදා වහන්සේ උදෙසා පුද සත්කාර කිරීම, වෙහෙර විහාර පිළිසකර කිරීම හා ගම්වර පූජා කිරීම, ශාසනික ගැටළු විසඳීම ආදී අංශ යටතේ රජු විසින් සිදුකළ ශාසනික සේවය ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය, ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය මඟින් අනාවරණය කොට ගත හැකිය.

උඩරට රාජධානියේ දේශපාලනය අතිශයින්ම ව්‍යාකූල තත්ත්වයකට පත්වූ වර්ෂය ලෙස දැක්විය හැකි ක්‍රි.ව. 1814 දක්වා, ශ්‍රී වික්‍රම රාජසිංහ

රජු බුදු සසුන හා භික්ෂූන් වහන්සේ උදෙසා සිය පාලන කාලය තුළ අනුග්‍රහ දැක්වුව ද මුල් කාලයට සාපේක්ෂව පසුව රජුගේ ප්‍රතිපත්ති ශාසනපීඩක සහ ප්‍රජාපීඩක වන්නට ඇති බව මෙකී මූලාශ්‍රය පරිශීලනයේදී එළඹිය හැකි නිගමනයකි.

මුඛ්‍ය පද :
ශ්‍රී වික්‍රම රාජසිංහ, උඩරට රාජධානිය, ආගමික සේවා, භික්ෂූන් වහන්සේ, දළදාව

**Key Words :**
Sri Wickrema Rajasingha, Kandyan Kingdom, Religious Services, Buddhist Monks, Tooth Relic

**හැඳින්වීම**

අනුරාධපුර රාජධානි සමයේ දෙවනපෑතිස් රජ දවස (ක්‍රි.පූ.307-267) සිදුවූ මහින්දාගමනයත් සමග මෙරට බුදු සසුන මැනවින් ප්‍රතිෂ්ඨාපනය කෙරුණු අතර එහිදී රජු ද බෞද්ධයෙකු බවට පත්වුණි. ඒ හේතුවෙන් ක්‍රමයෙන් රාජත්වය සමග සමීපව බැඳී පවතින ආයතනයක් බවට බුදු සසුන පත්වූ අතරලංකාවේ පාලකයා බෞද්ධයෙක් වීමට හා බෞද්ධ පාලන ප්‍රතිපත්තිවලට අනුකූලව රාජ පාලනය සිදුකිරීමට බැඳී සිටීම මෙකී ඓතිහාසික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විය. (ගුණවර්ධන, 1993:174-175)

මෙරට රාජත්වය ස්ථාපනය කරනු ලැබූ විජය රජුට අනුශාසනා කිරීමේ කාර්යය රජුගේ ප්‍රධාන අමාත්‍ය මෙන්ම පුරෝහිතයා ද වූ උපතිස්ස නම් බ්‍රාහ්මණයා සිදු කළ අතර ඒ තත්ත්වය මහින්දාගමනය සිදුවන තෙක්ම පැවති බව වංසකතා අනුව පැහැදිලි වේ. එහෙත් බුදු සසුන මෙරට ප්‍රතිෂ්ඨාපනය වීමත් සමග රජුගේ අනුශාසකයා වශයෙන් බ්‍රාහ්මණයන්ට පැවරුණු කාර්යය බෞද්ධ භික්ෂූන් වහන්සේට පැවරිණි. කල්යත්ම භික්ෂූන් වහන්සේ කෙතරම් අධිකාරී බලයක් වර්ධනය කරගත්තේ ද යත් රජුන් තනන්නා මෙන්ම රජුන් නසන්නා ලෙස ද කටයුතු කිරීමට පසුබට නොවූ බව පෙනේ.(ගුණවර්ධන, 1993:179-181)

මේ තත්ත්වය අනුරාධපුර රාජධානි සමයේ පටන් උඩරට රාජධානි සමය දක්වා අඛණ්ඩව පැවති අතර උඩරට රාජධානි සමය වන විට රජුට

පමණක් හිමිවුණු වරප්‍රසාද හා ගරු සැලකිලි භික්ෂූන් වහන්සේට ද හිමිව තිබූ බව, උඩරට රාජධානිය පිළිබඳ ස්වකීය අත්දැකීම් අළලා විස්තරාත්මක ග්‍රන්ථයක් රචනා කරන ලද ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස්ගේ වාර්තාවලින් පැහැදිලි වේ.(Knox,1981:214-126)උඩරට රාජධානියේ අවසානය සනිටුහන් කෙරුණු ශ්‍රී වික්‍රම රාජසිංහ සමය (1798-1815) තුළ ද ඒ තත්ත්වය ඒ ආකාරයෙන්ම පැවති බව වර්ෂ 1802 දී පමණ කන්ද උඩරටට පැමිණි ඉංග්‍රීසි ජාතික රොබට් පර්සිවල්ගේ වාර්ත ***An Account of the Island of Ceylon***නමින් ප්‍රකාශයට පත්කෙරුණු පර්සිවල්ගේ කෘතියේ සිංහලයන්ගේ ආගමික පසුබිම පිළිබඳ විස්තර කිරීමට වෙන්කළ පරිච්ඡේදයේ දක්වෙන අන්දමට ලංකා සමාජය තුළ සියල්ලන්ටම වඩා ඉහළින් සළකන ලද්දේ භික්ෂූන් වහන්සේට ය. භික්ෂූන් වහන්සේ සතු වූ බලය කෙතෙක් වී ද යත් කන්ද උඩරට රාජධානියේ අසහාය පාලකයා ලෙස පෙනී සිටි රජුට පවා භික්ෂූන් වහන්සේගෙන් උපදෙස් ලබාගැනීමට සිදුව තිබුණි. මේ නිසා රජු විසින් උන්වහන්සේගේ සිත් දිනාගනිමින් කටයුතු කිරීමට නොයෙක් අන්දමේ පුදසත්කාර භික්ෂුව විෂයෙහි කර තිබේ. විටෙක රජුට එරෙහිව සටන් කිරීම සඳහා භික්ෂූන් වහන්සේ විසින් රටවැසියා පෙළඹවීම පවා සිදු කළ ද, රාජද්‍රෝහී වරදට උන්වහන්සේට මරණ දණ්ඩනය නියම කිරීමට සර්ව බලධාරී රජුට නොහැකි බව අවසාන වශයෙන් පර්සිවල් සඳහන් කරයි.(Percival, 1803:201)

එහෙත්පර්සිවල් අවසානයට දක්වන කරුණට එකඟ විය නොහැකි අවස්ථා කීපයක්ම කන්ද උඩරට ඉතිහාසය පිරික්සීමේදී දැකගත හැකිය. II රාජසිංහ රජුට (1635-1687) එරෙහි කැරැල්ලකට නායකත්වය ලබාදුන් භික්ෂූන් වහන්සේ රජුගේ අණින් හිසගසා දැමුණු බව එවකට උඩරට රජුගේ සිරකරුවෙක් ලෙස රැඳී සිටි රොබට් නොක්ස් දක්වන අතර (Knox, 1981:216) සබරගමු කැරැල්ලට සම්බන්ධ වීමේ චෝදනාව මත භික්ෂූන් වහන්සේ පිරිසක් සිරගත කිරීමටත්, පරණතලා උන්නාන්සේ නම් භික්ෂුව මරාදැමීමටත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කටයුතු කර තිබේ.(De Silva,1953:150)මේ නිසා රාජද්‍රෝහීවීමේ අවස්ථාවකදී හැරෙන්නට අනෙක් සෑම අවස්ථාවකදීම රජුට පවා අත තැබිය නොහැකි ගෞරවනීය ස්ථානයක් රාජධානිය තුළ භික්ෂූන් වහන්සේ සතුවිය.

## ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ශාසනික ප්‍රතිපත්තිය

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ශාසනික ප්‍රතිපත්තිය පිළිබඳ සලකා බැලීමේදී එය නිර්මාණයෙහිලා රජුගේ කුඩා අවධියේ පටන් පැවති තත්ත්වය ප්‍රබලව බලපෑ බව පෙනෙන්නට තිබේ. කුඩා කන්නසාමි කුමරු මල්වතු විහාරයේ වැඩ වාසය කළ මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන් සහ කොබ්බෑකඩුවේ සිරිනිවාස අනුනාහිමියන් වැනි වියත් නාහිමිවරුන් සෙවණේ අධ්‍යාපනය හදාළ අතර ක්‍රමයෙන් උන්වහන්සේ සහ කුමරු අතර සමීප සබඳතාවක් ගොඩනැගී තිබූ බව කියැවේ.(සිල්වා, 1963:2)

කන්නසාමි කුමරු සිහසුනට පත්වූ පසුව ද එකී සමීප ඇසුර අඛණ්ඩව පැවතුණු බව එවකට ඉංග්‍රීසි ආණ්ඩුකාර ෆ්‍රෙඩ්රික් නෝර්ත් විසින් වර්ෂ 1800 අගෝස්තු 4 වනදා ඉන්දියාවේ අග්‍රාණ්ඩුකාර වෙලස්ලි වංශාධිපතිට යැවූ ලිපියෙන් තහවුරු වේ. මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ දැඩි ගෞරවයට පාත්‍ර වූ භික්ෂුවක් බවත්, උන්වහන්සේට අවශ්‍ය විටෙක රජු බැහැ දැකීමේ අවසරය හිමිව ඇති බවත්, එනිසා උන්වහන්සේගේ මාර්ගයෙන් රජු සමග මිත්‍රත්වයක් ඇතිකරගැනීමට තමා අපේක්ෂා කරන බවත් එම ලිපියෙන් නෝර්ත් දන්වා සිටියි.(විමලානන්ද,1967:11-12) මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන්ගේ දිනපොතේ ද රජු උන්වහන්සේ බැහැදැකීම සඳහා පැමිණි අවස්ථා පිළිබඳ සඳහන් වන අතර (***මොරතොට දිනපොත***, 2006:29) උන්වහන්සේ රජුගේ ගුරුවරයෙක් වීම සහ රජුගේ අනුශාසයෙක් වශයෙන් ද කටයුතු කළ හෙයින් "රාජගුරු" නමින් හැඳින්වුණු බව සැලව ලිපියේ සඳහන් වේ. (ධම්මානන්ද හිමි, 1969:157-158)

එලෙස භික්ෂූන් වහන්සේ සමග සමීප සබඳතාවක් පැවැත්වූ රජු විසින් අනුගමනය කළ ශාසනික ප්‍රතිපත්තිය පිළිබඳ විමසීමේදී අධ්‍යයන පහසුව තකා එම ප්‍රතිපත්තිය,

දළදා වහන්සේට කරන ලද පුද සත්කාර

වෙහෙර විහාර පිළිසකර කිරීම සහ ගම්වර පිදීම

භික්ෂූන් වහන්සේගේ හැකියාවන් අගය කිරීම

ශාසනික ගැටළු විසඳීම

යන කරුණු ඔස්සේ වර්ග කොට දැක්විය හැකිය.

## ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ශාසනික ප්‍රතිපත්තිය

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ශාසනික ප්‍රතිපත්තිය පිළිබඳ සලකා බැලීමේදී එය නිර්මාණයෙහිලා රජුගේ කුඩා අවධියේ පටන් පැවති තත්ත්වය ප්‍රබලව බලපෑ බව පෙනෙන්නට තිබේ. කුඩා කන්නසාමි කුමරු මල්වතු විහාරයේ වැඩ වාසය කළ මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන් සහ කොබ්බෑකඩුවේ සිරිනිවාස අනුනාහිමියන් වැනි වියත් නාහිමිවරුන් සෙවණේ අධ්‍යාපනය හදාළ අතර ක්‍රමයෙන් උන්වහන්සේ සහ කුමරු අතර සමීප සබඳතාවක් ගොඩනැඟී තිබූ බව කියැවේ.(සිල්වා, 1963:2)

කන්නසාමි කුමරු සිහසුනට පත්වූ පසුව ද එකී සමීප ඇසුර අඛණ්ඩව පැවතුණු බව එවකට ඉංග්‍රීසි ආණ්ඩුකාර ෆ්‍රෙඩරික් නෝර්ත් විසින් වර්ෂ 1800 අගෝස්තු 4 වනදා ඉන්දියාවේ අග්‍රාණ්ඩුකාර වෙලස්ලි වංශාධිපතිට යැවූ ලිපියෙන් තහවුරු වේ. මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ දැඩි ගෞරවයට පාත්‍ර වූ භික්ෂුවක් බවත්, උන්වහන්සේට අවශ්‍ය විටෙක රජු බැහැ දැකීමේ අවසරය හිමිව ඇති බවත්, එනිසා උන්වහන්සේගේ මාර්ගයෙන් රජු සමග මිත්‍රත්වයක් ඇතිකරගැනීමට තමා අපේක්ෂා කරන බවත් එම ලිපියෙන් නෝර්ත් දන්වා සිටියි.(විමලානන්ද,1967:11-12) මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන්ගේ දිනපොතේ ද රජු උන්වහන්සේ බැහැදැකීම සඳහා පැමිණි අවස්ථා පිළිබඳ සඳහන් වන අතර (*මොරතොට දිනපොත*, 2006:29) උන්වහන්සේ රජුගේ ගුරුවරයෙක් වීම සහ රජුගේ අනුශාසයෙක් වශයෙන් ද කටයුතු කළ හෙයින් "රාජගුරු" නමින් හැඳින්වුණු බව සැලව ලිපියේ සඳහන් වේ. (ධම්මානන්ද හිමි, 1969:157-158)

එලෙස භික්ෂූන් වහන්සේ සමග සමීප සබඳතාවක් පැවැත්වූ රජු විසින් අනුගමනය කළ ශාසනික ප්‍රතිපත්තිය පිළිබඳ විමසීමේදී අධ්‍යයන පහසුව තකා එම ප්‍රතිපත්තිය,

දළදා වහන්සේට කරන ලද පුද සත්කාර

වෙහෙර විහාර පිළිසකර කිරීම සහ ගම්වර පිදීම

භික්ෂූන් වහන්සේගේ හැකියාවන් අගය කිරීම

ශාසනික ගැටළු විසඳීම

යන කරුණු ඔස්සේ වර්ග කොට දැක්විය හැකිය.

**දළදා වහන්සේට කරන ලද පුද සත්කාර**

අනුරාධපුර රාජධානි සමයේ කිත්සිරිමෙවන් රජ දවස (304-332) හේමමාලා සහ දන්ත කුමරුන් විසින් දළදා වහන්සේ කලිඟු රට සිට මෙරටට වැඩම කරවනු ලැබූ අතර කිත්සිරිමෙවන් රජු විසින් ලංකා රාජ්‍යයෙන් දළදාව පුදනු ලැබූ බව මූලාශ්‍රය සඳහන් කරයි.(*දළදා සිරිත*,2000:64) කල්යත්ම "ලක්දිව සිහසුන් දරන්නා භාරයේ දළදාව තිබිය යුතුය" යන සංකල්පය තහවුරු වීමත් සමග ලාංකේය රාජත්වයේ සංකේතය වශයෙන් දළදා වහන්සේ සලකන ලදී. මේ නිසා ලක්දිව සිහසුනට පත් සෑම පාලකයෙකුම පාහේ දළදා වහන්සේ උදෙසා අනේකවිධ පුදසත්කාර කළ බව පෙනේ. (වජිර හිමි, 1983:166-168)

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ද පෙර සිරිත් අනුව යමින් දළදා වහන්සේ උදෙසා පුද සිරිත් නොකඩවා සිදුකළ බවත්, දළදා ප්‍රදර්ශනයක් රජු විසින් පැවැත් වූ බවත්, ඒ අවස්ථාවේදී සිරකරුවන් නිදහස් කිරීමක් සිදු කළ බවත් සමකාලීන ලේඛනයක් වන ***දළදා විත්තියේ*** සඳහන් වේ. දළදා වහන්සේට ගරුකිරීමක් වශයෙන් මෙම සිරකරුවන් නිදහස් කරන්නට ඇතැයි සිතිය හැකි අතර නිදහස ලැබූවන් හට ඔවුන් සිරගතවීමට පෙර හිමිව තිබූ ඉඩකඩම් නැවත පවරා දී ජීවනෝපාය සලසා දීමට ද රජු පියවර ගත් බව වැඩිදුරටත් එහි සඳහන් වේ.(***දළදා විත්තිය***, 1974:3-4,7)

විශේෂයෙන්ම රජුගේ පාලන කාලයේ මුල් වකවානුවේදී උඩරටට එල්ලවුණු ඉංග්‍රීසි ආක්‍රමණය හමුවේ දළදා වහන්සේගේ ආරක්ෂණය උදෙසා රජු විසින් විශේෂ වැඩපිළිවෙලක් සකසා තිබූ බව පෙනේ. උපායශීලී වූ රජු හඟුරන්කෙත බලා පසුබැසීමට තීරණය කර තිබූ අතර දළදා වහන්සේගේ ආරක්ෂාව උදෙසා ද ඒ ආශ්‍රිත විහාර කිහිපයක් රජු විසින් තෝරාගෙන තිබුණි. ඒ අනුව කිතුල්පේ, වැගම, මැදපිටිය, වල්ලිවෙල හා හඟුරන්කෙත යන ප්‍රදේශවල විහාර කිහිපයකට දළදා වහන්සේ වරින් වර වැඩම කරවනු ලැබූ අතර දළදා තේවාව අඛණ්ඩ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් ද රජු විසින් සපයා දෙනු ලැබූ බව මූලාශ්‍රය සඳහන් කරයි.(***දළදා විත්තිය***, 1974:8-10, ***ඉංග්‍රීසි හටන විමර්ශනය***, 2001:71-73 කවි)

රජු විසින් දළදා තේවාව සඳහා, දළදාව උඩරටට වැඩම කරවූ සමයේ පටන් එහි ආරක්ෂාව උදෙසා ඇප කැප වූ අස්ගිරි පාර්ශවෙන් වාරියපොල සුමංගල අනුනාහිමියන් තෝරා පත්කරනු ලැබ තිබූ අතර දළදාවේ ආරක්ෂාව උදෙසා වටිනා මැණික් ගලින් සරසන ලද කරඬු දෙකක් ද පූජා කොට තිබුණි. (Pieris, 1950:324-325) ඉංග්‍රීසී ආක්‍රමණය ජය ගැනීමෙන් අනතුරුව නැවතත් දළදා වහන්සේ මහනුවරට වැඩම කරවනු ලැබූ අතර පසු කලෙක රජු විසින් දළදා මාළිගයේ ශිලාමය තොරණක් ඉදිකරවීම සඳහා කටයුතු කළ බවත් කියැවේ.(සිල්වා, 1963:54)

**වෙහෙර විහාර පිළිසකර කිරීම සහ ගම්වර පිදීම**

ලක්දිව බුදු සසුන ප්‍රතිෂ්ඨාපන කරනු ලැබූ මිහිඳු මාහිමියන්ට අතපැන් වත්කොට සඟ සතුකොට පූජා කරන ලද මහමෙවුනා උයන මෙරට සිදුකරන ලද ප්‍රථම ආරාම පූජාව වශයෙන් වංසකතා දක්වන අතර (*මහාවංසො*, 2006:15 පරි. 24-26 ගාථා) එතැන් පටන් ලක්දිව පාලකයන් ඇතුළු බොහෝ දෙනෙකු බුදු සසුන උදෙසා වෙහෙර විහාර ඉදිකරවීම් හා ගම්බිම් පූජා කිරීම් ද අප්‍රමාණව සිදුකර ඇති බව සාහිත්‍ය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් පෙනෙන්නට තිබේ.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ද පෙර රජුන් අනුව යමින් රාජධානිය පුරා විසිර පැවති වෙහෙර විහාර රාශියක් උදෙසා සිදුකළ ගම්වර පිදීම් මෙන්ම පිළිසකර කිරීම් පිළිබඳ තොරතුරු බහුල වශයෙන් දැකගත හැකිය. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ, කලින් කලට සිදුකළ යුතු පිළිසකර කිරීම් සිදු නොකිරීම මෙන්ම නිලධාරීන්ගේ පැවති ආකාර්යක්ෂමතාව වැනි හේතූන් මත වෙහෙර විහාර රාශියක් මේ වන විට විනාශ මුඛයට පත්වෙමින් පැවතුණි. ඒ පිළිබඳ රජුගේ අවධානය යොමුවීමත් සමග රජු සිහසුනට පත්වූ වසරේ සිටම එබඳු විහාරවල චිරස්ථිතිය සඳහා අවශ්‍ය පියවර ගැනුණු බව පෙනෙන්නට තිබේ.

ඒ වකවානුව වන විට විනාශ මුඛයට පත්ව තිබූ පෙණෙන දියඉන්නේ ගනේලන්ද විහාරය පිළිසකර කරවීමෙන් පසු එම කුසල කර්මය රජුට අනුමෝදන් කෙරුණු අවස්ථාවේදී ප්‍රසාදයට පත් රජු, වර්ෂ 1802 දී මාවතගම නම් භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවට ගනේලන්ද විහාරය පූජා කළ බවත්, විහාරයේ නඩත්තුව

උදෙසා උඩගම නම් ග්‍රාමය පූජා කළ බවත් ගනේලන්ද විහාර තුඩපතේ සඳහන් වේ.(ඥාණවිමල හිමි,2001:266-267)
කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් පිළිසකර කරවා තිබූ කොණ්ඩදෙණිය විහාරය මේ වකවානුව වනවිට ලන්දේසී හා ඉංග්‍රීසි ආක්‍රමණ හේතුවෙන් විනාශ මුඛයට පත්ව තිබූ හෙයින් රජුගේ අණින් පිළිසකර කරවා රජුගේ ප්‍රතිරූපයක් ද විහාරයට පූජා කෙරුණු බව කොණ්ඩදෙනියේ සන්නසේ දක්වා තිබේ. රෙදිකඩක අඳින ලද ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සම්පූර්ණ ප්‍රමාණයේ මෙම සිතුවම තවමත් සුරක්ෂිතව විහාරයේ තබා තිබෙනු දුටු බව පූජ්‍ය නාවුල්ලලේ ධම්මානන්ද හිමියෝ සඳහන් කරති.(ධම්මානන්ද හිමි,1969:198-201) තවත් මෙවැනි අන්දමේ රජුගේ සිතුවමක් වර්ෂ 1804 දී රජු විසින් ප්‍රතිසංස්කරණය කරවනු ලැබූ නියම්ගම්පාය රජමහ විහාරයට පූජා කර තිබේ.(Pieris, 1950:100)

තවද සබරගමුවේ පිහිටි කිරඹ ගල් විහාරයේකටයුතු සඳහා රජු විසින් ගම් බිම් පූජා කළ බවත්, එය රත් සඳුන් අරටුවකින් කරන ලද සන්නසකින් ප්‍රදානය කළ බවත්, එහෙත් පසු කලෙක විහාරය පාලුවට යාම හේතුවෙන් රත් සඳුන් සන්නස විනාශයට පත්ව ඇති බවත් කියැවේ.(ඥාණවිමල හිමි,2001:255-256) රාජධානියේ සංචාරය කරන විටත් රජු රාජධානියේ පිහිටි වෙහෙර විහාර පිළිබඳ අවධානය යොමුකළ බව කියැවේ. වරක් සුදුහුම්පොළ විහාරයට පැමිණි රජුට තමන්වහන්සේලාට මුහුණ දීමට සිදුව තිබෙන දුෂ්කරතා පිළිබඳ විහාරයේ වැඩ වසන භික්ෂූන් වහන්සේ පැමිණිලි කොට ඇති අතර ඊට විසඳුමක් වශයෙන් මාතලේ කුඹලෝලුව ග්‍රාමය රජු විසින් සුදුහුම්පොළ විහාරයට පූජා කොට විහාරයේ නායක පදවිය මහවත්තේ උන්නාන්සේ නම් භික්ෂුවට භාර කළ බව කියැවේ.(Lawrie,1896:361)

මේ හැරෙන්නට රජුගේ සෘජු මැදිහත්වීමෙන් සිදුකරනු ලැබූ වෙහෙර විහාර පිළිසකර කිරීම හා ගම්වර පූජා කිරීම් අතරට බෝගොඩ රජමහ විහාරය ප්‍රතිසංස්කරණය කරවීම (ශ්‍රී.ලං.රා.ලේ., 5/63/142/2), ලංකාතිලක රජමහ විහාරයේ කටයුතු සඳහා ඇරැව්වාවල ග්‍රාමයේ ගොඩමඩ ඉඩම් පූජා කිරීම, බුත්තල යුදගනාපිටිය රජමහ විහාරයේ කටයුතු සඳහා ගම් බිම් පූජා කිරීම, කුකුළු කෝරළයේ පල්ලෙත්තුවේ ගලතර ග්‍රාමය පොත්ගුල් විහාරයේ විහාරාධිපති මිල්ලපිටියේ සීලවංස නාහිමියන්ට පූජා කිරීම සහ මල්වතු අස්ගිරි උභය පාර්ශව භික්ෂූන් වහන්සේ හතළිස්

නමක් උදෙසා දිනපතා දන් පිළිගැන්වීම සඳහා ගම්පොළ කෙත් යායක් වෙන් කරවීම යනාදිය දැක්විය හැකිය.(සිල්වා, 1963:54)

ඉහත සඳහන් කළ ආකාරයට රජු විසින් සිදුකරන ලද වෙහෙර විහාර පිළිසකර කරවීම් සහ ගම්වර පූජා කිරීම්වලට අතිරේකව රාජකීය නිලධාරීන් විසින් ද රජුගේ නියෝගවලට අනුව වෙහෙර විහාර පිළිසකර කිරීම් සහ ගම්වර පූජා කිරීම් සිදුකළ බව කියැවේ.

වර්ෂ 1798 දී රජු ගේ නියෝගයෙන් දුම්බර නිලමේ විසින් මාරගල විහාරයේ වැඩ විසූ වේපතඉර නම් භික්ෂූන් වහන්සේට සබරගමු දිසාවේ අටකලන් කෝරළේ නිලතුරේ ග්‍රාමය පූජා කළ බව මාරගල විහාර තුඩපතේ සඳහන් වන අතර (ඤාණවිමල හිමි,2001:188) වර්ෂ 1806 දී රජුගේ අණ පරිදි ඇත්තලවත්තේ විහාරයේ වැඩ වාසය කළ පාලටුවේ සෝභිත නම් භික්ෂූන් වහන්සේට පිළිමතලව්වේ මහාදිකාරම් විසින් සබරගමු දිසාවේ අටකලන් කෝරළයේ පහළඹුමාදම්පේ නම් ග්‍රාමය පූජා කළ බව ඇත්තලවත්තේ විහාර තුඩපතේ සඳහන් වේ.(ධම්මානන්ද හිමි,1969:192)

එසේම තමන්ගේ නිලධාරීන් විසින් ස්වාධීනව සිදුකරන ලද වෙහෙර විහාර පිළිසකර කරවීම් උදෙසා ද රජු විසින් අනුග්‍රහ දක්වන්නට කටයුතු කර තිබේ. එයට කදිම නිදසුන වන්නේ රජුගේ පළමු අදිකාරම් ලෙස සේවය කළ පිළිමතලව්වේ මහ නිළමේ විසින් කරවන ලද අස්ගිරි විජයසුන්දාරාම නව විහාරයට රජු විසින් සිදුකළ ගම්වර පූජාවයි.

පිළිමතලව්වේ පරපුරේ සාමාජිකයන් විසින් දිගු කලක පටන් අස්ගිරි විජයසුන්දරාරාම මහාවිහාරයේ කටයුතු සඳහා අනුග්‍රහ දක්වමින් නව විහාර කර්මාන්ත කරවූ අතර එය අනුගමනය කරමින් පිළිමතලව්වේ මහ නිළමේ විසින් බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා සහ සිතුවම් සහිත නව විහාර මන්දිරයක් ඉදි කරවන්නට යෙදුණි. උඩ විහාරය නමින් ප්‍රකට වුණු එම විහාරයේ නේත්‍රා ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය සඳහා පිළිමතලව්වේ විසින් රජුට ආරාධනා කළ අතර එය පිළිගත් රජු තම මව් බිසව හා බිසෝවරුන් සමග ඒ සඳහා පැමිණි බව කියැවේ. නව විහාර කර්මාන්තය පිළිබඳ අතිශය ප්‍රසාදයට පත් රජු සහ මව් බිසව විසින් සාරසිය පත්තුවේ කහවත්ත සහ මාතලේ දිසාවේ අස්ගිරි කෝරයේ අස්ගිරි යන ග්‍රාමයන් අස්ගිරි මහවිහාරයේ කටයුතු උදෙසා පූජා කළ බව

අස්ගිරි අලුත් විහාර ලිපියේ සඳහන් වේ.(ධම්මානන්ද හිමි,1969:39-42)මෙම පූජාව පිළිබඳ සඳහන් තල්පත විහාර බුද්ධ ප්‍රතිමාව ඉදිරියේ තැන්පත් කළ රජු එය විහාරයේ ගල් පර්වතයක කෙටවීමට නියෝග කළ අතර දෙපෝයකින් නැවත පැමිණි රජු ශිලා ලේඛනය නිවැරදි කොටා ඇති අන්දම පිළිබඳ සතුටු වී එයට දායක වූ ශිල්පීන්ට රජවාසළ මහ අරමුදලින් ගෙවීම් සිදුකිරීමට ද නියම කළ බව කියැවේ.(Lawrie,1896:74-76)

රජු සහ රාජකීය නිලධාරීන්ට අමතරව මේ වකවානුවේදී භික්ෂූන් වහන්සේ පවා වෙහෙර විහාර පිළිසකර කිරීම සඳහා යොමුව තිබෙන අතර උන්වහන්සේගේ එම කටයුතු උදෙසා රාජකීය අනුග්‍රහය හිමිව තිබෙන බව පෙනේ. මේ භික්ෂූන් අතරින් රාජගුරු මොරතොට ධම්මක්ඛන්ධ මහනාහිමියන් විශේෂ ය. උන්වහන්සේ විසින් ඒ වන විට ජරාවාසව පැවති සැලව විහාරය පිළිසකර කරවා ඒ බව රජුට දැනුම් දුන් අවස්ථාවේදී රජු එහි පැමිණ විහාර කර්මාන්තය පිළිබඳ ප්‍රසාදයට පත්ව ගම්වර පූජා කළ බව කියැවේ. රජු විසින් සැලව ග්‍රාමය ඇතුළුව දෙබජ්ජම, කිතුල්වත්තදෙණිය, කිඳිගොඩ කෝරළයේ වල්ගම්පත්තුවේ ඉලුක්තැන්නේ බෝගහකුඹුර ආදී ප්‍රදේශවල ගොඩ මඩ ඉඩම් රාශියක් විහාරයට පූජා කෙරුණු බව විහාරයේ පිහිටවූ සෙල්ලිපියේ සඳහන් වේ. ලක්දිව රජතුමෙකු විසින් පිහිටුවන ලද අවසන් සෙල්ලිපිය වන්නේ ද මෙම සෙල්ලිපියයි.(ධම්මානන්ද හිමි,1969:157-158)

තවද කොට්ටඉඹුල්වල අනෝමදස්සී නම් භික්ෂූන් වහන්සේ විසින් වර්ෂ 1808 දී නව විහාර කර්මාන්ත සිදුකරවා එහි පින් රජතුමාට අනුමෝදන් කළ අවස්ථාවේදී ප්‍රසාදයට පත්වූ රජු විසින් අක්කර පසළොස් දහසකට නොඅඩු ගොඩ මඩ ඉඩම් ප්‍රමාණයක් උන්වහන්සේගේ භාරකාරීත්වය යටතේ පැවති කොට්ටඉඹුල්වල රජමහ විහාරයට සහ අරමණපොල රජමහ විහාරයට පූජා කළ බව කොට්ටඉඹුල්වල විහාර තඹ සන්නස සඳහන් වේ.(ඤාණවිමල හිමි, 2001:181-183) මේ හැරෙන්නට වැලිගම අග්‍රබෝධි විහාරයේ සහ එම විහාර සංඝයේ සෑම විහාරයකම වර්ෂ 1809 දී සිදුකරනු ලැබූ පින්කම් සියල්ලම රජුට අනුමෝදන් කර තිබෙන බව පුණ්‍යානුමෝදනා පත්‍රයක දැකගත හැකිය.

ඒ පිළිබඳව ද රජු ප්‍රසාදයට පත්වන්නට ඇතැයි සිතිය හැකි නමුත් රජු විසින් එම විහාර සංඝයට සිදුකරන ලද ගම්වර පූජාකිරීමක් පිළිබඳ

තොරතුරු හමු නොවේ. මෙම පුණ්‍යානුමෝදනා පත්‍රය විශේෂ වන්නේ මේ සියලු පින්කම්වල ආනුභාවයෙන් රජුට බුදු බව ප්‍රාර්ථනා කිරීමට අවසානයේදී ලේඛකයා කටයුතු කර තිබීම හේතුවෙනි.(වනරතන හිමි, 2008:273-276)

**භික්ෂූන් වහන්සේගේ හැකියාවන් අගය කිරීම**

බුදු සසුන සහ රාජත්වය අතර පවතින සමීප සබඳතාව යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාහැකි වන්නේ භික්ෂුව සහ රජු අතර හිතවත්භාවයක් පැවතියහොත් පමණි. මෙහිදී වෙහෙර විහාර පිළිසකර කරවීම සහ ගම්වර පූජා කරවීමට අමතරව උන්වහන්සේගේ දක්ෂතා අගය කිරීමෙන් ද එකී හිතවත්භාවය පවත්වාගෙන යාමට ලක්දිව පාලකයන් කටයුතු කර තිබේ. මේ නිසා භික්ෂූන් වහන්සේ ද තමන්වහන්සේගේ දක්ෂතා ප්‍රකට කරවමින් රජුගේ ප්‍රසාදයට පාත්‍රවීමට ප්‍රිය කළ බව පෙනේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ සමය තුළ ද මේ තත්ත්වය සුලභව දකගත හැකිය.

මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන්ගේ සහ උන්වහන්සේගේ මිත්‍ර හිමිනමක් වූ කරඳන දේවරක්ඛිත නම් භික්ෂූන් වහන්සේ අතර නිතර හසුන්පත් හුවමාරු වුණු අතර දිනක් මහනාහිමියන් බැහැදකීමට පැමිණි රජුට කරඳන දේවරක්ඛිත හිමියන් එවූ හසුන්පතක් දකගැනීමට ලැබුණි. උන්වහන්සේගේ අක්ෂරවල තිබූ අලංකාර භාවය පිළිබඳ ප්‍රසාදයට පත් වූ රජු මේ අකුරුවලින් තමන්ටත් බණ පොතක් ලියවා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ. තමන්වහන්සේගේ මිතුරු භික්ෂුවට උපකාරයක් කළ හැකි අවස්ථාවක් එළඹුණු හෙයින් ඒ බව මහනාහිමියන් දේවරක්ඛිත හිමියන්ට දන්වීමත් සමග උන්වහන්සේ විසින් මැඳුම් සඟිය සම්පූර්ණයෙන්ම පුස්කොළ පොතක ලියා රජුට පිළිගන්වන ලදී. එයින් අතිශය ප්‍රසාදයට පත් වූ රජු උන්වහන්සේට අවශ්‍ය කුමක්දැයි විමසූ බවත්, මියන කොළ මිටක් කඩාගැනීම දුම්බර කීරගම ලැබුණොත් යහපත් යැයි දේවරක්ඛිත හිමියන් පිළිවදන් දුන් බවත්, ඒ අනුව රජු ප්‍රමාණයෙන් අක්කර අටදහස් තුන්සිය පහක් පමණ වූ දුම්බර කීරගම ග්‍රාමය උන්වහන්සේට පූජා කළ බවත් කියවේ. ඒ බව වර්ෂ 1801 දී නිකුත් කරන ලද නැඳුන් විහාර තුඩපතෙන් සනාථ වේ.(ඤාණවිමල හිමි,2001:48,50-51)

මේ හැරෙන්නට වර්ෂ 1812 දී අක්මීමන සිරිධම්ම නම් තරුණ භික්ෂූන් වහන්සේ විසින් ඇහැලේපොළ මහ නිළමේ සිදු කළ පින්කමක් වර්ණනා කරමින් පාලි බසින් ප්‍රබන්ධයක් කළ අතර එය රජුගේ අතට ද පත්වුණි. එම පාලි ප්‍රබන්ධයේ සාරගර්භ බව පිළිබඳ පැහැදුණු රජු බාල වියේ පසු වූ භික්ෂූන් වහන්සේ නමක් එබඳු උසස් ප්‍රබන්ධයක් කිරීම අගය කරමින් සිරිධම්ම හිමියන්ට සබරගමු දිසාවේ අටකලන් කෝරළයේ රණබාහුගම නම් වූ අක්කර 400 ක ප්‍රමාණයක් සහිත ග්‍රාමය පූජා කළ බව කියැවේ.(වීරසූරිය,2008:69) තවද රජවාසළ ධර්ම දේශනා පැවැත්වීම සඳහා වැඩම කළ සතර කෝරළයේ වතුරේ බුද්ධරක්ඛිත නම් භික්ෂූන් වහන්සේගේ ව්‍යක්ත ධර්ම කථික බව පිළිබඳ පැහැදුණු රජු ඉහත ආකාරයටම උන්වහන්සේව අගය කරමින් රන් පත්හිඳක් සහ උන්වහන්සේ වැඩ වාසය කළ වතුරේ රජමහ විහාරයට ඉඩකඩම් පූජා කළ බව කියැවේ.(යටවර,2005:56)

එවන් පසුබිමක් තුළ රජුට සෙත් පැතීම හා රජුව වර්ණනා කරමින් රජුගේ ප්‍රසාදය ලබාගැනීමට ද භික්ෂූන් වහන්සේලා කටයුතු කළ බව පෙනේ. එකල මල්වතු විහාරයේ වැඩ විසූ පුවක්මොටේ නම් භික්ෂූන් වහන්සේ විසින් ඒ දිනවල රජු මඳක් ගිලන්ව පසු වූ හෙයින් සෙත් කවියක් රචනාකොට රජුට නිරෝගී සුව පැතීමට කටයුතු කර තිබුණි. එහෙත් උන්වහන්සේගේ සතුරෙකු විසින් රජුට ඒ පිළිබඳ කරුණු විකෘති කොට සැළකිරීම හේතුවෙන් ***පුවක්මොටේ බලි ශාන්තිය*** නමින් කාව්‍ය ප්‍රබන්ධයක් කළ පුවක්මොටේ හිමියෝ එයින් නැවතත් රජුට සෙත් පැතීමට කටයුතු කළහ. අවසානයේදී එම කාව්‍ය ප්‍රබන්ධය රජුට ඔප්පු කළ අවස්ථාවේදී ප්‍රසාදයට පත් රජු පුවක්මොටේ හිමියන්ට ගම්වරයක් පූජා කළ බව කියැවේ.(සිල්වා, 1963:45) මේ හැරෙන්නට පාගාවැවේ උන්නාන්සේ නම් භික්ෂූන් වහන්සේ විසින් රජු වර්ණනා කරමින් ***ශ්‍රී වික්‍රමඅලංකාරය*** නම් කාව්‍ය ප්‍රබන්ධය කළ අතර උන්වහන්සේගේ අරමුණු වී තිබුණේ එවකට විනාශමුඛයට පත්ව තිබූ අනුරාධපුර ථූපාරාම දාගැබ පිළිසකර කිරීම සඳහා රාජානුග්‍රහය ලබා ගැනීමයි.(ශ්‍රී.ලං.රා.ලේ., 5/63/100/5)

**ශාසනික ගැටළු විසඳීම**

බුදු සසුන පිළිබඳ මෙන්ම භික්ෂූන් වහන්සේ සම්බන්ධ ගැටළු ඇතිවූ අවස්ථාවලදී සමයාරක්ෂකයා වශයෙන් රජු මැදිහත් වී එම ගැටළු විසඳීමට කටයුතු කළ බවට අනුරාධපුර යුගයේ පටන් සාධක හමුවේ.

විශේෂයෙන්ම සංඝ සංශෝධන, ශාසන කතිකාවත් ආදිය රජුගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු අතර විටෙක රජුගේ නියමයෙන් ධර්ම විනය පිළිබඳ ව්‍යක්ත රාජ නිලධාරීන් ද ශාසනික ගැටළු විසඳීම සඳහා මැදිහත් වූ බව පෙනේ. උඩරට රාජධානි සමය තුළ ද භික්ෂූන් වහන්සේලා සහ විහාරස්ථාන සම්බන්ධ විවිධ ගැටළු පැනනැඟුණු අවස්ථාවලදී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින්ම මැදිහත් වී ඒවා විසඳාලීමට කටයුතු කර තිබෙනු දැකිය හැකිය.

වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ ශිෂ්‍යයෙක් වූ රඹුක්වැල්ලේ ධම්මරක්ඛිත නම් භික්ෂූන් වහන්සේ එකල කුංකුණාවේ හිමියන් නමින් පතළව සිටි අතර උන්වහන්සේට සඟරජ හිමියන් විසින් වැල්ලාගල නම් විහාරය පවරා දී තිබුණි. එවකට මල්වතු මහාවිහාරයේ අනුනායක පදවිය ඉසිලූ මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන් හා කුංකුණාවේ හිමියන් අතර පැවති පුද්ගලික එදිරිවාදිකම් උත්සන්න වූයේ ධම්මක්ඛන්ධ නාහිමියන් මල්වතු මහානායක වීමත් සමග වැල්ලාගල විහාරයෙන් කුංකුණාවේ හිමියන් පලවා හැරීමට කටයුතු කිරීමෙනි. විහාරයක් නොමැතිව අසරණ භාවයට පැමිණි කුංකුණාවේ හිමියන් විසින් තමන්වහන්සේ පත්ව ඇති තත්ත්වය පිළිබඳ ***වෙහෙර විත්තිය*** නම් කාව්‍ය සංග්‍රහය මඟින් රජුට දන්වා සිටින ලදී. මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් රජු අන්තම්පට්ටු විහාරය කුංකුණාවේ හිමියන්ට පූජා කළ අතර එම විහාරයෙන් ද උන්වහන්සේ පළවා හැරීමට ගත් වෑයම රජුගේ ආධාරයෙන් ව්‍යර්ථ කිරීමට කුංකුණාවේ හිමියන්ට හැකිවුණි. මෙලෙස තමන්වහන්සේට රජු දැක්වූ අනුග්‍රහය පිළිබඳ සතුටට පත්වූ කුංකුණාවේ හිමියන් විසින් ***රාම සන්දේශය*** නම් ගාථා 65 කින් සමන්විත පාලි කාව්‍ය සංග්‍රහය රචනා කොට ඉන් හඟුරන්කෙත දේවාලයේ රාම දෙවියන්ගෙන් රජුට සෙත පතන ලෙස අයැද තිබේ.(***සරසවිය 6 කලාපය***, 1969:134-137)

විටෙක රාජ නිලධාරීන් අතින් භික්ෂූන් වහන්සේට සහ බුදුසසුනට සිදුවන අකටයුතුකම් නිවැරදි කරවීමට ද රජු පියවර ගෙන තිබුණි. සබරගමු දිසාවේ අටකලන් කෝරළයේ ප්‍රාදේශීය නිලධාරියෙක් වශයෙන් කටයුතු කළ මාකඳුරේ මොහොට්ටාල විසින් ගනේගොඩ විහාරයේ කටයුතු සඳහා පූජාකොට තිබූ ඉඩම් ස්වකීය පුද්ගලික කටයුතු උදෙසා යොදාගැනීම පිළිබඳ රජුගේ අවධානයට යොමුවීමත් සමග වර්ෂ 1807 දී

නැවතත් එම ඉඩම් විහාරයට පවරා දීමට රජු විසින් කටයුතු කර තිබේ.(ඤාණවිමල හිමි,1967:68-169)

තවද රඹුක්වැල්ලේ රතනජෝති නම් භික්ෂූන් වහන්සේට රාජාධිරාජසිංහ රජු විසින් කෙවුල්ගම සන්නස මඟින් පූජාකරනු ලැබූ කෙවුල්ගම විහාරය පසුව පිළිමතලව්වේ මහාදිකාරම් විසින් ස්වකීය අභිමතය පරිදි මැණික්දිවෙල උන්නාන්සේ නම් භික්ෂූන් වහන්සේට පැවරීමට කටයුතු කර තිබුණි. මේ පිළිබඳ යටිනුවර රාළ නම් කොඩිතුවක්කු නිළමේ විසින් එවකට උඩරටට එල්ල වූ ඉංග්‍රීසි ආක්‍රමණය හේතුවෙන් හඟුරන්කෙත මාළිගාවේ රැඳී සිටි රජුට පැමිණිලි කරන ලද අතර ඒ පිළිබඳ අවධානය යොමු කළ රජු, පිළිමතලව්වේ මහාදිකාරම්ට තරවටු කොට නැවතත් රඹුක්වැල්ලේ හිමියන්ට කෙවුල්ගම විහාරයට පවරා දීමට නියෝග කළේ ය. එපමණක් නොව සටන් නිමාවීමත් සමග කෙවුල්ගම විහාරයට පැමිණ තමාගේ නියෝගය නිසි පරිදි ක්‍රියාත්මක වූයේදැයි සොයාබැලීමට පවා රජු කටයුතු කළ බව කියැවේ. (Lawrie, 1896:437-438) රාජධානිය තුළ යුදමය තත්ත්වයක් ඇතිව තිබීමෙන් තමා අතිශය කාර්යබහුලව සිටිය ද සමයාරක්ෂකයා වශයෙන් තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටුකිරීමට රජු සෑම විටම උත්සහ ගත් බව මින් පැහැදිලි වේ.

සාමාන්‍ය ජනතාව අතින් වුව ද භික්ෂූන් වහන්සේට සිදුවූ අකටයුතුකම් පිළිබඳ රජුගේ අවධානය යොමු වූ බව පහත සිදුවීමෙන් පැහැදිලි වේ. මැද්දේගම ධම්මරක්ඛිත නම් භික්ෂූන් වහන්සේට ධර්ම ලේඛනයක බරපැන වශයෙන් අලුත්ගේ උපාසක නයිදේ නම් පුද්ගලයා විසින් ඉඩමක් පූජා කළ අතර පසුව උන්වහන්සේ සමග ඇතිවූ අමනාපයක් හේතුකොටගෙන එම ඉඩම එකී පුද්ගලයා විසින්ම දළදා වහන්සේට පූජා කරන්නට යෙදුණි. සාංඝික දේපළක් නැවතත් පුද්ගලික පරිහරණයට ගත නොහැකි හෙයින් එකී ඉඩම ධම්මරක්ඛිත හිමියන්ට අහිමිකරවීමේ අරමුණින් දළදා වහන්සේට පූජා කිරීමට අලුත්ගේ උපාසක නයිදේ කටයුතු කළ බව පැහැදිලි ය. නමුත් මේ පිළිබඳ ධම්මරක්ඛිත හිමියන් විසින් රජුට පැමිණිලි කිරීමත් සමග සිද්ධිය විමසා බැලූ රජු නැවතත් එකී ඉඩම ධම්මරක්ඛිත හිමියන්ට පවරා දුන් බව තුඩපතකින් අනාවරණය වේ.(ඤාණවිමල හිමි,1967:158-159)

මේ හැරෙන්නට පොදුවේ ශාසනය සම්බන්ධ අර්බුදයන්හිදී රජු අවසන් තීරකයා වශයෙන් පිළිගත් බව හැඟවෙන සිදුවීම් කිහිපයක් ද දැකගත හැකිය. වර්ෂ 1753 දී පිහිටවනු ලැබූ සියම් උපසම්පදාව කාලයත් සමගම ගොවිකුල වංශියන්ට පමණක් සීමා වීම හේතුවෙන් අන් කුලවලට අයත් සාමණේරවරුන් අපහසුතාවකට පත්ව තිබුණි. (*මන්දාරම්පුර පුවත*, 1958:823-862 කවි) මේ නිසා සියම් උපසම්පදාව ගොවිකුල නොවන සාමණේරවරුන්ට ද ලබාගැනීමේ අරමුණ පෙරදැරිව මිහිරිපැන්නේ ධම්මරතන නම් සාමණේරයන් විසින් ඒ සඳහා රජුගේ මැදිහත් වීම අපේක්ෂා කරමින් සිංහල සිලෝ ප්‍රබන්ධයක් රචනා කර තිබේ. කෙසේ වෙතත් පැවති දේශපාලන හා ආගමික වාතාවරණය අනුව එය ඉටුකරදීමට රජුට හැකියාවක් නොවූ බව පෙනේ.(වීරසූරිය, 2008:152-153)

තවද වර්ෂ 1800 දී පමණ පහතරට විහාරයක් පිළිබඳ ගැටළුවක් රජු විභාග කළ අවස්ථාව වැදගත් සිදුවීමකි. පහතරට ප්‍රදේශයේ තැනුම්පොත විහාරය සම්බන්ධව ඇතිවුණු ගැටළුවකදී එය විසඳාලීම සඳහා මල්වතු මහනායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන් විසින් උඩ පාත දෙරට භික්ෂු නියෝජිත මණ්ඩලයක් ඉදිරියේ ප්‍රශ්නය විභාග කළ අතර එයින් ලබාදුන් තීන්දුව හිරිඹුරේ ආනන්ද නම් භික්ෂූන් වහන්සේ පිළිනොගත් හෙයින් ප්‍රදේශයේ ඉංග්‍රීසි අධිකරණය වෙතට ද ගැටළුව යොමු කෙරුණි. නමුත් ඉංග්‍රීසි අධිකරණයෙන් ද පෙර තීන්දුවම තහවුරු කළ හෙයින් මෙම ගැටළුව විසඳාගැනීම සඳහා තැනුම්පොත විහාරයේ දායකයන් විසින් කන්ද උඩරට රජුට අභියාචනා කොට තිබේ.(වනරතන හිමි,2008:109-113) මේ සිදුවීම වැදගත් වන්නේ තැනුම්පොත විහාරය පහතරට ඉංග්‍රීසි පාලන ප්‍රදේශයේ පිහිටා තිබුණ ද බුදුසසුන සම්බන්ධ ගැටළුවකදී කන්ද උඩරට රජු අවසන් තීරකයා වශයෙන් පහතරට ජනතාව පවා පිළිගත් බව තහවුරු වන හෙයිනි. එනිසා දේශපාලනික අතින් රට බෙදී පැවතුණ ද ආගමික අතින් එක්සේසත් බවක් පවත්වා ගෙන යාමට කන්ද උඩරට රජවරුන් ඉදිරිපත් වූ අවස්ථාවක් වශයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේදී වාර්තා වන මෙම සිදුවීම දැක්විය හැකිය.

**සමාලෝචනය**

ප්‍රධාන වශයෙන් අංශ හතරක් ඔස්සේ ඉදිරිපත් කෙරුණු කරුණුවලට අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් විටෙක සිංහල රජුන් පවා පරයන

අන්දමේ ශාසනික සේවා ඉටුකරන ලද බව පෙනෙන්නට තිබේ. පෙර සඳහන් කළ අන්දමට ලක්දිව පාලකයා බෞද්ධයෙක් වීම හා බෞද්ධ ප්‍රතිපත්තිවලට අනුකූලව පාලනය ගෙනයාමට බැඳීසිටීම යන සම්ප්‍රදාය හේතුකොටගෙන රජු එසේ සිදුකරන්නට ඇතැයි යමෙකුට පැවසිය හැකි වුව ද ඊට වඩා පුළුල් හේතු කිහිපයක් මෙම කටයුතු පසුබිමෙහි වූ බව පැහැදිලි ය.

රජකමට උරුමකම් තිබූ මුත්තුසාමි කුමරු පරයා සිහසුන හිමිකරගැනීමට සමත් වුව ද, රාජ උරුමය පිළිබඳ ගැටළුව ශ්‍රී වික්‍රම රාජසිංහට නිරන්තර අභියෝගයක් විය. එසේම කන්ද උඩරට රාජත්වය රඳා පැවති ව්‍යුහය ද මේ තත්ත්වය සඳහා බලපෑමක් කරන්නට ඇත. එනම් භික්ෂූන්, රදළයන් හා සාමාන්‍ය ජනතාව මත කන්ද උඩරට රාජත්වය රඳා පැවති අතර භික්ෂූන්ගේ පක්ෂපාතීත්වය හිමිකරගැනීම අනෙක් දෙකොට්ඨාසයේම පක්ෂපාතීත්වය තහවුරු කරගැනීමේ මාර්ගය වී තිබුණි. ඔහුගේ ශාසනික සේවයට මෙකී තත්ත්වය බලපා ඇති බව සිතිය හැකිය.

ශ්‍රී වික්‍රම රාජසිංහ සිහසුන් පැමිණි තැන් පටන් අනුගමනය කළ ප්‍රතිපත්තියක් ලෙස රදළ බලය බිඳ දැමීම හඳුනාගත හැකි අතර ඒ හේතුවෙන් මතුවිය හැකි රදළ විරෝධය මර්දනය කිරීමේ එක් උපායක් ලෙස ද රජුගේ ශාසන සේවය මෙන්ම රදළයන්ගේ ශාසනික කටයුතු උදෙසා අනුග්‍රහ දැක්වීම ද හඳුනාගත හැකිය. අනෙක් අතට බුදුසසුනට අනුග්‍රහ දක්වන පාලකයන් සැමවිටම ජනතාවගේ සිත් දිනාගනු ලැබූ අතර රදළයන් තමාට එරෙහි වුව ද භික්ෂූන් සහ ජනතාව තමා පිළිගනු ඇතැයි රජුගේ විශ්වාසය වන්නට ඇත.
එහෙත් ශාසනික ප්‍රතිපත්ති උපයෝගී කොටගනිමින් ස්ථාවර පාලනයක් පවත්වාගැනීමේ රජුගේ සැලසුම ව්‍යර්ථ වූ බව පෙනෙන්නේ රදළයන් රජුට එරෙහි වීමත්, ඒ අනුව යමින් භික්ෂූන් වහන්සේ සහ ජනතාව ද රජුට එරෙහි වීමත් හේතුවෙනි. අවසානයේදී ඉංග්‍රීසීන්ගේ සහය ලබාගත් රදළයන් වර්ෂ 1815 දී රජු බලයෙන් පහකිරීමට ද සමත් වුණි.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. ***ඉංග්‍රීසි හටන විමර්ශනය*** (2001), සරත්, ලයනල් (සං.ස්.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
2. ***දළදා විත්තිය*** (1974), සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (සංස්.), ලේක්හවුස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය, කොළඹ.
3. ***දළදා සිරිත*** (2000), ගුණවර්ධන, වී.ඩී.එස්. (සංස්.), සමයවර්ධන ප්‍රකාශන, කොළඹ.
4. ***මන්දාරම්පුරපුවත*** (1958), ලංකානන්දහිමි, ලබුගම (සංස්.), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.
5. ***මහාවංසො*** (2006), ඉලංගසිංහ, මංගල (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
6. ***මොරතොට දිනපොත*** (2006), යටවර, එම්.ඩී.එම්.එස්. (සංස්.), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.
7. ගුණවර්ධන, රණවීර (1993), ***සිවුර සහ නගුල***, සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ 5.
8. ඥාණවිමල හිමි, කිරිඇල්ලේ (1967), ***සපරගමු දර්ශන***, ශාස්ත්‍රෝදය මුද්‍රණාලය, රත්නපුරය.
9. ඥාණවිමල හිමි, කිරිඇල්ලේ (2001), ***සපරගමුවේ පැරණි ලියවිලි***, මානව හිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.
10. ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969), ***මධ්‍යම ලංකා පුරාවෘත්ත***, සී/ස ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.
11. යටවර, එම්.ඩී.එම්.එස්. (2005), ***ඉසුරු බෝ ලත් වතුර සහ කැගලු ප්‍රවේණිය***, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.
12. වජිර හිමි, කුඹුරුගමුවේ (1983), ***දළදා ඉතිහාසය සහ සංස්කෘතිය***, උසස් අධ්‍යාපන අමාත්‍යංශය, කොළඹ.
13. වනරතන හිමි, කඹුරුගමුවේ (2008), ***රුහුණේ පැරණි අත්ලිපි***, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
14. වීරසූරිය, පී.ඩී.ඇස්. (2008), ***මාතර සාහිත්‍ය වංශය***, ඇස්.ගොඩගේ සහ සමාගම, කොළඹ 10.
15. සිල්වා, මේලියස් (1963), ***අපේ අන්තිම රජතුමා***, සී/ස ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.
16. විමලානන්ද, තෙන්නකෝන් (1966/1967), "ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරතුමා, මල්වතු මහ නායක හිමි සහ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු", ***ඉතිහාස සඟරාව 1 කලාපය***, විද්‍යෝදය විශ්වවිද්‍යාලය.
17. ***සරසවිය 6 කලාපය*** (1968/1969), විද්‍යෝදය විශ්ව විද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමය, නුගේගොඩ.

18. De Silva, Colvin R. (1953), ***Ceylon Under the British Occupation Vol I***, Colombo Apothecaries' Co. Ltd., Colombo.
19. ***Diary of Mr. John D'Oyly*** (1995), Navrang, New Delhi.
20. Knox, Robert (1981), ***An Historical Relation of Ceylon***, Tisara Prakasakayo Ltd., Dehiwala.
21. Lawrie, A.C. (1896), ***Gazetteer of the Central Provinces of Ceylon Vol I***, Government Printers, Colombo.
22. Percival, Robert (1803), ***An Account of the Island of Ceylon***, C & R. Boldwin, London.
23. Pieris, P.E. (1950), ***Sinhalē and the Patriots***, Colombo Apothecaries Company Ltd., Colombo.
24. ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරය 5/63/142/2
25. ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරය 5/63/100/5- ***ශ්‍රී වික්‍රමඅලංකාරය***